අමිල අබේවික්‍රම
116/105, ගලබොඩ වත්ත,
මොරුද පාර, පිළියන්දල.
06.08.2019

ප්‍රධාන විදුලි අධිකාරීතුමා,
ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය,
කැස්බෑව ප්‍රාදේශිය කාර්යාලය.

ප්‍රිය මහත්මයාණනි,

**<u>අංක 2102095606 දරන විදුලි ගිණුමේ ශේෂය පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගැනීම</u>**

අමිල අබේවික්‍රම වන මම ඉහත ලිපිනය දරන නිවසේ වර්ථමාන හිමිකරු වන අතර අංක **2102095606** දරන විදුලි ගිණුමේ හිමිකරු ද වෙමි.

2019 මාර්තු මාසයෙදී ඉහත කී විදුලි ගිණුමේ ශේෂය නිවසේ පෙර අයිතිකරු විසින් **සම්පූර්ණයෙන්** පියවන ලද අතර අදාළ ලදුපත් ද මා වෙත භාර කරන ලදී. එතැන් පටන් අදාළ නිවාස මා භාරයේ පවතින අතර සිදු කරගෙන යන අලුත්වැඩියා කටයුතු නිසා දැනට එහි කිසිවෙකු පදිංචි වී නොමැත. එබැවින් නිවසේ විදුලි පරිභෝජනය **ඉතා අල්ප තත්වයක පවතී**. 2019 මැයි මස විදුලි ගිණුම් ප්‍රකාශනයට අනුව එම මස 19 දින වන විට පාවිච්චි කල එකක ගණන 11 ක් වූ අතර ගෙවිය යුතු මුළු ශේෂය **රු: 56.52** ක් ලෙස සටහන්ව තිබීමෙන් ම ඔබට එය පැහැදිලි වනු ඇත.

එහෙත්, ජුනි මස විදුලි ගිණුම් ප්‍රකාශනයට අනුව දැනට කිසිවෙකු පදිංචි නොවන මෙම නිවසේ පාවිච්චි කල විදුලි එකක ගණන 61 ක් වූ අතර ගෙවිය යුතු මුළු ශේෂය **රු: 627.52** ක් (එම මස අය කිරීම **රු: 571.00** ක්) ලෙස සටහන්ව තිබිණි.

ඉහත කරුණ සම්බන්ධයෙන් මා විමතියට පත් නොවුනේ "අදාළ මනු කියවුම් නිලධාරියා පැමිණෙන දිනයේදී නිවස වසා තිබුණු බැවින් ඔහු විසින් මීන් පෙර විදුලි පරිභෝජනයන් අධ්‍යයනය කර දල අගයක් සටහන් කොට යන්න ඇත "යන උපකල්පනය මත පදනම්ව ය. එබැවින් මා **26.06.2019** දින **රු: 985.00** ක මුදලක් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවන ලද අතර අදාළ විදුලි ගිණුම මා නමට හරවා ගැනීමට ද කටයුතු කලේ ඉහත කී ගැටළුව ජූලි මස විදුලි ගිණුම් ප්‍රකාශනයෙන් නිරාකරණය වනු ඇතැයි බලාපොරොත්තුවෙනි.

**එහෙත් සිදුවූයේ ගැටළුව තවත් සංකීර්ණ වීමයි. එනම් මා ගෙවන ලද මුදලින් රු: 571.00 ක මුදලක් ඔබ ආයතනය විසින් අසාධාරණ ලෙස මගෙන් අය කරගෙන ඇති අතර මෙම මස අය කිරීම ලෙස තවත් රු: 586.70 ක මුදලක් සටහන් කොට තිබීමයි.**

**ඔබ ආයතනයේ මනු කියවුම් නිලධාරියා පැමිණෙන දිනයක් පිළිබඳව මා හරියාකාරව නොදන්නා නිසා වසා ඇති නිවසේ ගේට්ටු විවර කර තැබිය නොහැකියාවක් මා හට පවතී.**

එබැවින් මනු කියවුම් නිලධාරියා පැමිණෙන නිශ්චිත දිනයක් පිළිබඳව මා දැනුවත් කරන මෙන් හා ඉහත කී මුදල් අය කර ගැනීමේ ගැටළුව ඔබ ආයතනයේ පරිගණක පද්ධතිය (computer System) අධාරයෙන් හෝ වෙන යම් අයුරකින් විසදා දෙන මෙන් ද මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමි.

සැ:යු - ඔබගේ පහසුවක් උදෙසා, අදාළ විදුලි ගිණුම් ප්‍රකාශනවල පිටපත් ද මේ සමග අමුණ එවමි. වැඩිදුර තොරතුරු උදෙසා පහත සදහන් දුරකථන අංක හරහා මා සම්බන්ධ කර ගැනීමට කාරුණික වන මෙන් ද ඉල්ලා සිටිමි.

හිතවත් පාරිභෝගික,

අමිල අබේවික්‍රම.
**දු:ක 071 3596700 / 076 8420899**